## කෝරලෙයි පත්තු උතුර ප්‍රාදේශීය සභාව

## මඩකලපුව දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 05 දින විගණනයට ඉදිරිපත් කර තිබුණ අතර ඉකුත් වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන 2010 ඔක්තෝබර් 11 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව කෝරලෙයි පත්තු උතුර ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කෝරලෙයි පත්තු උතුර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 අනුකූල නොවීම්

විගණනයේදී අනාවරණය වූ නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති , රීතී , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තිය | ඉදිකිරීම් සඳහා ගෙවීමකින් 1% ක රඳවා ගැනීම් බදු රු.34,287 ක් අයකර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2010 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,236,011 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.78,123 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම

සභාපති විසින් සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු සභාවේ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | - | - | - | - | - | 10 |
| (ii) | බදු කුලී | 761 | 761 | - | 165 | 167 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 432 | 432 | 29 | 306 | 324 | - |
| (iv) | වෙනත් ආදායම | 507 | 507 | - | 1,006 | 1,006 | - |

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත වියදම, තථ්‍ය වියදම හා විචලනය පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 7,351 | 6,097 | 1,254 | 5,498 | 4,320 | 1,178 |
| වෙනත් | 2,062 | 802 | 1,260 | 1,465 | 806 | 659 |
| උප එකතුව | 9,413 | 6,899 | 2,514 | 6,963 | 5,126 | 1,837 |
| මූලධන වියදම | 8,960 | 32,372 | (23,412) | 1,133 | 14,853 | (13,720) |
| මුළු එකතුව | 18,373 | 39,271 | (20,898) | 8,096 | 19,979 | (11,883) |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය

සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | 2010 දෙසැම්බර් 31 දිනට අනුමත | 2010 දෙසැම්බර් 31 දිනට තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | - |
| ද්විතීය ශ්‍රේණිය | 09 | 09 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 13 | 12 |
| වෙනත් ( අනියම් / තාවකාලික ) | 01 | 01 |
| | 24 | 22 |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 සමීක්ෂණය නොකළ ස්ථාවර වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු කර නොගෙන පොත්වල දැක්වෙන ශේෂය මත ගණනය කරන ලද වත්කම්වල වටිනාකම රු.62,781,849 ක් විය.

**2.6 අභ්‍යන්තර විගණනය**

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) ආදායම් පරිපාලනය